03

# පෙර සූදානම



සමන්පුර විද්‍යාලයේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව මාර්තු මස 22 වැනි දිනට යෙදී තිබිණි. ඊට සහභාගි වන සිසුන් රැස් කර විදුහල්පතිතුමා විශේෂ උපදෙස් හා අවවාද රැසක් දුන්නේ ය. එහි අදාළ කොටසක් පහත දැක්වෙයි.

“හෙට උදේ හතරයි තිහට පාසල් භූමියෙන් පිටත් වෙනවා. පාන්දර හතර වෙන කොට සියලු ම ශිෂ්‍යයන් පාසලට පැමිණිය යුතුයි. දෙමාපියන් හෝ භාරකරුවෙක් පැමිණිය යුතුයි. ආපසු පැමිණෙන විට රාත්‍රී 10.00 පමණ වෙයි. ඒ බවත් දෙමවුපියන්ට කියන්න.”

## ක්‍රියාකාරකම්

01). පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

අ) සිසුන් විසින් පිළිපැදිය යුතු යැයි විදුහල්පතිතුමා පැවසූ උපදෙස් පහක් කියන්න.

ආ) සිසුන් විසින් දෙමවුපියන්ට දැන්විය යුතු කරුණු මොනවා ද?

02). පහත සඳහන් වාක්‍ය කියවන්න.

අ. i. ළමයා පොත කියවයි.

ii. ගුරුවරයා ළමයාට පාඩම කියා දෙයි.

iii. ගුරුවරයා ළමයාගෙන් පොත ඉල්ලයි.

iv. ළමයාගේ පොත ගුරුවරයා ඉල්ලා ගනියි.

මේ වාක්‍යවල ළමයා යන පදය යෙදෙන අයුරු හඳුනා ගන්න. ළමයා, ළමයාට, ළමයාගෙන්, ළමයාගේ යන විවිධ රූප වාක්‍යයන්හි යෙදෙන පිළිවෙළ අනුව වෙනස් අර්ථ දක්වයි.

ආ. පහත දී ඇති වාක්‍ය කියවන්න.

i. ළමයෙක් පොත කියවයි.

ii. ගුරුවරයා ළමයකුට පාඩම කියාදෙයි.

iii. ගුරුවරයා ළමයකුගෙන් පොත ඉල්ලයි.

iv. ළමයෙකුගේ පොත ගුරුවරයා ඉල්ලා ගනියි.

ඉහත අ, ආ වාක්‍ය යුගලවල ඇති වෙනස වටහා ගන්න.

වගුවේ '**අ**' සහ '**ආ**' කොටස්වල ඇතුළත් වාක්‍ය යුගල අතර ඇති වෙනස හඳුනා ගනිමු.

"ආ" කොටසේ වාක්‍යවල උක්ත ලෙස යොදා තිබෙන නාමපදවලින් හඟවන තැනැත්තා නිශ්චිත නැත. නියම/ නියත නැති බව ප්‍රකාශ කිරීමට "එක් /අක්" ප්‍රත්‍ය යෙදේ. මේ අනියමාර්ථ ප්‍රත්‍යයි. පුරුෂ ලිංග පද සමග 'එක්' ප්‍රත්‍යය යෙදේ. ස්ත්‍රී ලිංග පද සමග "අක්" ප්‍රත්‍යය යෙදේ. නපුංසක ලිංග නාම පද සමග ද "අක්" යෙදේ.

02). හිස්තැනට ගැළපෙන අනියමාර්ථ නාම පද වරහනින් තෝරා යොද පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ................................................. රුගුම් පැවා ය.
(නිළියක්, නිළියෙක්, නිළියක)

ii. ................................................. පැන දුවයි.
(මුවකු, මුවා, මුවෙක්)

iii. ................................................. දිය ගෙනෙයි.
(ගැහැනියක, ගැහැනියක්, ගැහැනිය)

iv. ප්‍රසිද්ධ චිත්‍ර ................................................. ප්‍රදර්ශනයක් පවත්වයි.
(ශිල්පියකු, ශිල්පියා, ශිල්පියෙක්)

v. ................................................. ආහාර පිසයි.
(නැගණිය, නැගණියක, නැගණියක්)

vi. ................................................. බිත්තර රකියි.
(කිකිළියක, කිකිළියක්, කිකිළිය)

viii. ජය ලැබූ ................................................. සිහිසුන් ව වැටුණා ය.
(ක්‍රීඩිකාව, ක්‍රීඩිකාවක, ක්‍රීඩිකාවක්)

04). පහත දැක්වෙන අනියමාර්ථ ප්‍රත්‍ය සහිත නාම පද යොදා වාක්‍ය සාදන්න.

i **පුතෙක්**

ii **කුරුල්ලෙක්**

iii **වඳුරකු**

iv **රජෙක්**

v **දැරියක**

vi **කම්කරුවෙක්**

vii **යෙහෙළියක්**

viii **තරුණියක**

ix **සේවකයකු**

x **මහල්ලෙක්**

06). නිදසුනට අනුව පහත සඳහන් වගුවේ හිස්තැනට සුදුසු වචනය ඔබේ අභ්‍යාස පොතේ ලියන්න. එම වචන යොදා හැකිතාක් අලුත් වාක්‍ය සාදන්න.

| | | | |
|---|---|---|---|
| ළමයා | ළමයාට | ළමයාගේ | ළමයාගෙන් |
| දරුවා | ________ | ________ | ________ |
| බල්ලා | ________ | ________ | ________ |
| බළලා | ________ | ________ | ________ |
| තාත්තා | ________ | ________ | ________ |
| අම්මා | ________ | ________ | ________ |
| මල්ලී | ________ | ________ | ________ |
| ගස | ________ | ගසේ | ගසෙන් / ගසින් |
| පොත | ________ | ________ | ________ |
| මේසය | ________ | ________ | ________ |
| පෑන | ________ | ________ | ________ |
| ළමයෙක් | ළමයෙකුට | ළමයකුගේ | ළමයෙකුගෙන් |
| දරුවෙක් | ________ | ________ | ________ |
| බල්ලෙක් | ________ | ________ | ________ |
| බළලෙක් | ________ | ________ | ________ |
| කාන්තාවක් | කාන්තාවකට | කාන්තාවකගේ | කාන්තාවකගෙන් |
| ගැහැනියක් | ________ | ________ | ________ |
| ගුරුවරියක් | ________ | ________ | ________ |
| ලිපිකාරියක් | ________ | ________ | ________ |
| ගසක් | ගසකට | ගසක | ගසකින් |
| මේසය | ________ | ________ | ________ |